**කිතුල් සංවර්ධන මණ්ඩලයේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2024**

-------------------------------------------------------------------------

කිතුල් සංවර්ධන මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක පීඊඞී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා ඊට අනුකූලව නිකුත් කළ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 හා 2024 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2025 සැප්තැම්බර් 15 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 හා 2024 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුනද 2022 වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ගිණුම්කරන අඩුපාඩු තිබීම හේතුකොටගෙන 2023 වර්ෂය සඳහා සකස්කළ මූල්‍ය ප්‍රකාශන නැවත සකස්කරන ලදී. නිවැරදි කරනලද මූල්‍ය ප්‍රකාශන 2025.09.17 වන දින ජාතික විගණන උප කාර්යාලය වෙත ලබා දුනි. | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

## 2.1 2022 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම්, වගකීම්,ආදායම් හා වියදම් තත්ත්වය

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **මුදල රු.** |
|---|---|
| ජංගම නොවන වත්කම් | 378,891 |
| ජංගම වත්කම් | 335,581 |
| **මුළු වත්කම්** | **714,472** |
| ජංගම බැරකම් | 308,613 |
| ජංගම නොවන බැරකම් | - |
| **මුළු බැරකම්** | **308,613** |
| මුළු හිමිකම් | 405,859 |
| **මුළු හිමිකම් හා බැරකම්** | **714,472** |
| මුළු ආදායම | 17,897,583 |
| මුළු වියදම | 17,491,724 |
| **ශුද්ධ ලාභය** | **405,859** |

## 2.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | **ඇප ලේඛනය**<br>ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි.<br>ඇප ලේඛනය පවත්වා ගෙනයාමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| **(ආ)** | **හානි පිළිබඳ ලේඛනය**<br>හානි පිළිබඳ ලේඛන පවත්වා ගෙන නොතිබුණි. | පිළිගනිමි.<br>හානි පිළිබඳ ලේඛනය පවත්වා ගෙනයාමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය පවත්වා ගත යුතුය. |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා ඊට අනුකූලව නිකුත් කළ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශය අත්පොතේ 2.3 වගන්තිය | අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ලඟාකර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවද මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී මණ්ඩලය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට (SLIDA) බාර දී ඇති අතර මෙම වර්ෂයේ එම සැලැස්ම අමාත්‍යාංශ ලේකම්තුමා වෙත ඉදිරිපත් කර ඇත. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව උපායමාර්ගික සැලැස්ම සකස් කර අනුමත කරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක ඉදිකර තිබුණු ගොඩනැගිල්ලක් 2022 වර්ෂයේ සිට කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් කිතුල් මැදුර නමින් කිතුල් නිෂ්පාදන අලෙවිසැලක් පවත්වා තිබූ අතර ඒ සඳහා 2023 වර්ෂයේ නොවැම්බර් 02 දින මණ්ඩලය විසින් රු.1,143,905 ක් වැය කර එම ගොඩනැගිල්ලේ පිවිසුම් මාර්ගයට ග්‍රීල් වැටක් සවිකර තිබුණද මෙම ගොඩනැගිල්ල පවරා ගැනීමට කටයුතු සිදු කර නොතිබූ අතර කිසිදු ආර්ථික කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම ගොඩනැගිල්ල ජල උල්පත් සඳහා වෙන්කළ රජයට අයත් රක්ෂිත භූමියක ඉදිකර ඇති බවට 2025.04.11 වන දින යටියන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඒවා ඇත. ඊට පිළිතුරු ලෙස අප මණ්ඩලය විසින් 2025.06.04 දිනැතිව යොමුකළ ලිපිය මගින් රු. 1,121,564.07 ක මුදල චෙක්පතක් මාර්ගයෙන් මෙම මණ්ඩලය වෙත ගෙවන ලෙස දන්වා යවා ඇත. | ඉඩම සහ ගොඩනැගිල්ල පවරාගෙන ඵලදායී කාර්යයකට යොදවා ගත යුතුයි. |
| (ආ) | තැලිගම කිතුල් මැදුර අලුත්වැඩියාවක් සඳහා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත 2024 දෙසැම්බර් 24 දින ලබා දී තිබුණු රු.1,121,564ක මුදල විගණන දින වන විටත් අදාල කාර්යය සඳහා භාවිත කිරීමට හෝ එම මුදල මණ්ඩලයට නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කෑගල්ල දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී ගනු ලැබූ තීරණයක් මත කමිටු සභාපති ,අමාත්‍යාංශ නිලධාරින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් හා අප මණ්ඩලයේ නිලධාරින් එක්ව ක්ෂේත්‍ර පරීක්ෂණයක් 2025.09.11 වන දින සිදුකල අතර , ඒ අනුව ජලපෝෂක ප්‍රදේශයේ පවතින එම ඉඩම ඉන් ඉවත්කර නිරවුල් කිරීමටත්, රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වයක් යටතේ (PPP Model ) මෙහි ඉදිරි කටයුතු සිදුකිරීමටත්, කිතුල් සංවර්ධන මණ්ඩලය ලබා දී ඇති මුදල් ප්‍රතිපාදන යොදාගෙන එම | ඉඩම සහ ගොඩනැගිල්ල පවරාගෙන ලබා දී ඇති මුදල් ඵලදායී කාර්යයකට යොදවා ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | | ගොඩනැගිල්ල නවීකරණය කිරීමටත් නිර්දේශ කර ඇත. |

## 3.2 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ 2021 මාර්තු 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව මණ්ඩලයෙන් ඉටු කිරීමට අපේක්ෂිත ඉඩම්වල කිතුල් වගා කිරීම සඳහා සහය ලබාදීම, ප්‍රවර්ධනය කිරීම හා විධිමත් කිරීම, කිතුල් වගාවන් සිදු කරන ඉඩම්වල සත්ව පාලනයේ නියැලීම ප්‍රවර්ධනය කිරීම, කිතුල් වගාවන්වල පොල් සහ අනෙකුත් භෝග වගා කිරීම සම්බන්ධ ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ කිතුල් නිෂ්පාදන නිපදවීම යන කාර්යයන් ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි. | පිළිගනිමි.<br>2024 වර්ෂයේ මෙම මණ්ඩලය සතුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටි අතර වැඩ බැලීමේ පදනමින් අමාත්‍යාංශයේ නිලධාරීන් කිහිපදෙනෙක් සේවය කළ අතර 2024 ඔක්තෝබර් මස සිට ස්ථිර පදනමෙන් කළමනාකරණ සහකාර නිලධාරීන් 05 දෙනෙක් බඳවා ගන්න ලදී. විධායක නිලධාරීන් කිසිවකු ස්ථිර පදනමින් සේවය කර නැත. එබැවින් සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය විසින් සැලසුම් කල කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වී ඇත. | කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීමේ මූලික අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | 2024 වර්ෂය තුළ කිතුල් ව්‍යවසායකයින් 05 දෙනෙකුට යහපත් නිෂ්පාදන පරිචය (GMP) සහතිකය සහ ව්‍යවසායකයින් 10 දෙනෙකුට කිතුල් සංවර්ධන මණ්ඩල (KDB) සහතිකය ලබා දීම වෙනුවෙන් රු.මිලියන 1.7ක ප්‍රතිපාදන වෙන්කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. | -එම- | සැලසුම් කරන ලද ව්‍යාපෘති හා කාර්යයන් වෙනුවෙන් මූලික ශක්‍යතා අධ්‍යනයක් මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව අධ්‍යනය කර ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2024 ක්‍රියාකාරකම් සැලැස්ම අනුව වාණිජ වගාවක් ලෙස කිතුල් වගාව සංවර්ධනය සඳහා ආදර්ශ කිතුල් ඉඩමක් සංවර්ධනය කිරීම වෙනුවෙන් වූ රු.700,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | -එම- | ක්‍රියාකාරී සැලැස්මේ කටයුතු ඉටු කිරීමටත් වෙන්කර ඇති මුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් ක්‍රියා කළ යුතුයි. |
| (ඈ) | 2024 ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය පරීක්ෂාවේදී කිතුල් සංවර්ධන මණ්ඩලය සඳහා මාර්ගගත වේදිකාවක් නිර්මාණය කිරීම යටතේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් පැවැත්වීම වෙනුවෙන් රු.700,000 ක් ප්‍රතිපාදනය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි. | -එම- | කිතුල් සංවර්ධන මණ්ඩලයේ ඵලදායීතාවය ඉහල නැංවීමට හැකි වන පරිදි වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛණයක් හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ලබා දී නොතිබුණි. | 2022/ 2023 වර්ෂ වල ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැත. | මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 39 ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 07 ක්ද වූ අතර අභ්‍යන්තර විගණක තනතුර, පර්යේෂණ හා සංවර්ධන සහකාර තනතුරු 15ක් හා කළමනාකරණ සහකාර තනතුරු 04ක් ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට පුරප්පාඩු වී තිබුණි. | අවස්ථා ගණනාවකදී මෙකී පුරප්පාඩු පිළිබදව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය දැනුවත් කර ඇත . | මණ්ඩලයේ කාර්යයන් නිසි ලෙස ඉටු කරවා ගැනීමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් නොපමාව සිදු කළ යුතුය. |